# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2084/59 - 2018 අගෝස්තු මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2018.08.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය

1948 අංක 13 දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත 1934 පෙබරවාරි මස 05 වැනි දින දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 51 වගන්තිය යටතේ වූ නිවේදනයයි

**නිවේදනය**

කලින් කල සංශෝධිත 1934.02.05 වැනි දින දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 02 වගන්තියට ඉනික්බිතිව අංක 1750/1 හා 2012 මාර්තු මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මගින් අංක 01 අතුරු වගන්තිය ඇතුළත් කිරීමෙන් සිදු කරනු ලැබූ සංශෝධනය ඉවත් කර පහත දැක්වෙන නව අතුරු වගන්තිය ඇතුළත් කිරීමෙන් එම ව්‍යවස්ථා සංග්‍රහය වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් 02, 03 වගන්ති යටතේ විධිවිධාන එසේම පවතී.

01. (අ) 2012 මාර්තු මස 19 වැනි දින හෝ ඉන් පසුව විශ්‍රාමික රජයේ නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත හෝ සේවා අවශ්‍යතා මත නැවත සේවයේ යොදවා විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීමේදී ඔවුන්ට පෙර ගෙවන ලද සම්පූර්ණ පාරිතෝෂිකය ඔවුන්ගේ නව ප්‍රදානයෙන් අය කළ යුතු ය.

(ආ) 2012 මාර්තු මස 19 දිනට පෙර නැවත සේවයේ යොදවාගත් නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීමේ දී කලින් ඔවුන් වෙත කරන ලද ප්‍රදානය අනුව ගෙවන ලද පාරිතෝෂිකයෙන් අදළ දිනය දක්වා අය කරන ලද පාරිතෝෂිකයේ වටිනාකම හැර ඉතිරි පාරිතෝෂිකයේ වටිනාකම සංශෝධනයෙන් පසු හිමි පාරිතෝෂිකයෙන් අඩුකර අවශ්‍ය ගැලපීම් සිදු කර ආපසු ගෙවිය යුතු මුදලක් වෙත් නම් ගෙවීම් කළ යුතු ය.

**ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර,**
රාජ්‍ය, පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍ය.

2018 අගෝස්තු මස 14 වැනි දින,
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

08 - 1150


1A - G 28314 — 08 (2018/08)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*